# ගරු කෘෂිකර්ම අමාත්‍යතුමාගේ සුභ පැතුම් පණිවිඩය



සමෘද්ධිමත් කෘෂි ආර්ථිකයක් බිහිකරලීමේ නිරන්තර උත්සාහයක නිරත වන කෘෂිකර්ම අමාත්‍යාංශය ඒ සඳහා ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන ආරම්භ කළේය. එහිදී තුන් අවුරුදු ආහාර නිෂ්පාදන සැලසුම් අනුව රටේ ආහාර නිෂ්පාදන ධාරිතාව පුළුල් කිරීමට කෘෂිකර්ම අමාත්‍යාංශයේ අවධානය යොමුව ඇත. දිවයිනේ සෑම ප්‍රදේශයක්ම, දිස්ත්‍රික්කයක්ම සහ පළාතක්ම ආවරණය වන පරිදි ක්‍රියාත්මක වන ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන වෙනුවෙන් ප්‍රමුඛ දායකත්වය ලබාදීමට හැකිවීම වත්මන් කෘෂිකර්ම අමාත්‍යවරයා ලෙස මා ලද අනගි අවස්ථාවකි. මෙම ක්‍රියාවලිය අඛණ්ඩව සහ සාර්ථකව ක්‍රියාත්මක වෙතැයි මා තුළ දැඩි විශ්වාසයක් පවතින අතර ඒ සඳහා හදවතින්ම සුබ පැතුම් එක්කරමි.

ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන යනු එක් පාර්ශවයකට පමණක් සිදු කළ හැකි දෙයක් නොවේ. සියලුම පළාත් මෙම වැඩසටහන සඳහා උපරිම දායකත්වය සැපයිය යුතුය. සෑම පාර්ශවයක් විසින්ම කළ යුතු කාර්යයන් නිසියාකාරව ඉටු කිරීම තුළ පමණක් මෙහි සාර්ථකත්වය රැඳී පවතියි.

මෙම තුන් අවුරුදු සැලැස්ම අනුව වඩාත් ක්‍රමානුකූලව වගා කටයුතු සිදු කළ යුතුය. ඒ ඒ පළාත්වල පවතින පාරිසරික සාධක මත පිහිටා පසට ගැලපෙන බෝගය හඳුනාගෙන වගා සැලැස්ම ක්‍රියාත්මක කිරීම වැදගත්ය. මෙම සාමුහික ක්‍රියාවලියේ දී ජාතික ඉලක්ක ජය ගැනීමට නම් පළාත් අතර නිවැරදි සන්නිවේදනයක් තුළින් අන්‍යයෝන්‍ය අවබෝධය වර්ධනය කර ගත යුතුය.

රටේ ජනතාවගේ පරිභෝජනය සඳහා අවශ්‍ය ආහාර රට තුළම නිෂ්පාදනය කරමින්, කෘෂි ආර්ථිකය සවිබල ගන්වන ගොවි ප්‍රජාවගේ අතමිට සරු කරමින් කෘෂිකර්ම අංශය දියුණු කිරීමට ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන ඉවහල් වනු ඇත. ඒ සඳහා දිවයිනේ සෑම පළාතක්ම ස්වකීය වගකීම නොපිරිහෙලා ඉටු කරනු ඇතැයි මම අපේක්ෂා කරමි. සීමා මායිම් පසෙකලා එකම අරමුණක් වෙනුවෙන් අප සැම එක්වන්නේ නම්, කෘෂිකර්ම අමාත්‍යාංශයේ අපේක්ෂාව සඵල වනු නිසැකය.

දුමින්ද දිසානායක (පා.ම)
කෘෂිකර්ම අමාත්‍ය

# කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමාගේ පණිවිඩය



දූපත් රාජ්‍යයක් වන අප විශිෂ්ඨ ගණයේලා සම්පත්වලට හිමිකම් කියන අතර ඉන් එක් සම්පතක් ලෙස කෘෂිකර්මාන්තය හැඳින්විය හැක. ග්‍රාමීය ජනතාවගෙන් 65% ක් පමණ කෘෂි ආර්ථිකයකට අයිතිවාසිකම් කියන අතර ඔවුන්ගේ දිවි පැවැත්ම කෘෂිකර්මාන්තය සමඟ බැඳී පවතී. තවද කාර්මික විප්ලවයත් සමඟ ලෝකයේ බොහෝ රටවල් නොයෙකුත් යාන්ත්‍රික කර්මාන්තවලට යොමු වීමත් සමඟ කෘෂිකර්මාන්තයට වූ අවධානය අඩු විණි. එහි ප්‍රතිඵලයක් ලෙස ආහාර සුරක්ෂිතතාව සම්බන්ධයෙන් විවිධ කතිකා ගෝලීය වශයෙන් ඇති කිරීමටත් විවිධ සම්මුතීන් ගෝලීය වශයෙන් ගෙන ඒමටත් සිදු විණි. අප ඉදිරියේ එලෙස පවතින ආහාර සුරක්ෂිතතාව පිළිබඳ අවධානම අවම මට්ටමක පවත්වා ගෙන යාම සඳහා ගරු ජනාධිපතිතුමාගේ සංකල්පයක් අනුව ගරු අග්‍රාමාත්‍යතුමාගේ උපදෙස් පරිදි ගරු කෘෂිකර්ම අමාත්‍ය දුමින්ද දිසානායක ඇමතිතුමාගේත්, ජනාධිපති කාර්යාලය සහ කෘෂිකර්ම අමාත්‍යාංශයේ මැදිහත් වීම මත ජාතික ආහාර නිෂ්පාදන තුන් අවුරුදු සැලැස්ම එළි දක්වන ලදී. මෙහි මුඛ්‍ය පරමාර්ථය වූයේ අප මිහිතලය තුල ස්වයංපෝෂිත ලෙස නිෂ්පාදනය කළ හැකි ආහාර බෝග වගා කිරීම සඳහා අවශ්‍ය විද්‍යාත්මක දැනුම, යටිතල පහසුකම්, බීජ, පොහොර වැනි අංග ලබා දෙමින් ගොවි ජනතාව සමඟ කෘෂිකර්ම අමාත්‍යාංශය හා ඊට අනුබද්ධ ආයතන එක් කර ගනිමින් 2018 වන විට මිරිස්, බී ලූණු, අල, මුං ඇට වැනි තෝරා ගත් මූලික බෝග ලැයිස්තුවකින් රට ස්වයංපෝෂිත කරවීමය. මෙම කර්තව්‍ය සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය ධෛර්යය සහ ශක්තිය සමස්ථ ගොවි ජනතාවටත් සියලූම නිලධාරීන්ටත් ලැබේවායි පතමි.

වසන්ත අලුවිහාරේ (පා.ම)
කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍ය

# දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යතුමාගේ පණිවිඩය



ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන 2016 - 2018 බෝග නිෂ්පාදන ඉලක්ක ඇතුලත් කර කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් සකස් කරනු ලබන වාර්තාවට සමගාමීව දකුණු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා ඒකාබද්ධව පළකරනු ලබන වාර්තාව සඳහා සුබ පැතුම් පණිවුඩයක් එක් කිරිමට ලැබීම පිළිබඳව දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යවරයා වශයෙන් අතිශයින් සතුටු වෙමි.

දැනට ශ්‍රී ලංකාව විසින් ප්‍රධාන අහාර වර්ග, සත්ව නිෂ්පාදන මෙන්ම මත්ස්‍ය නිෂ්පාදන ආනයනය සඳහා වාර්ෂිකව රුපියල් බිලියන 200ක් පමණ වැය කරනු ලබයි. එහෙත්, ආනයනය කරනු ලබන එම ආහාර වලින් වැඩි ප්‍රමාණයක් දේශීයව වස විසෙන් තොරව ගුණාත්මකව නිෂ්පාදනය කර ගැනීමේ හැකියාව ඇති අතර සත්ව නිෂ්පාදන මෙන්ම, මත්ස්‍ය නිෂ්පාදනද, තවදුරටත් වැඩිකර ගැනීමේ හැකියාව පවතී. වාර්ෂිකව වැයවෙන ආනයනය වියදම අඩුකර ගනිමින් දේශීයව නිපදවිය හැකි සියළුම ආහාර වර්ග උපරිම වශයෙන් මෙරටෙහි නිෂ්පාදනය කර ගැනිම කාලීන අවශතාවයක් බවට පත්ව ඇත.

තවද ශ්‍රී ලංකාවේ ආහාර පරිභෝජන තත්වයන් සලකා බලන විට පෝෂණවේදීන්ගේ නිර්දේශයන්ට අනුව ඒක පුද්ගල දෛනික එළවලු හා පළතුරු පරිභෝජනය ග්‍රෑම් 200 බැගින් විය යුතු වුවද, එය මේ වනවිට ග්‍රෑම් 100ක පමණ මට්ටමක පවතී. එමෙන්ම ඒක පුද්ගල මත්ස්‍ය පරිභෝජනය දිනකට ග්‍රෑම් 60ක් විය යුතු වුවත් එය දිනකට ග්‍රෑම් 40ක් පමණ විමද ඒක පුද්ගල කිරි ආශ්‍රිත නිෂ්පාදන පරිභෝජනය දිනකට මිලි ලීටර් 100ක් වුවත් එය ද පහළ මට්ටමක පැවතීමත් ශ්‍රී ලංකාවේ ජනතාවගේ පෝෂණ මට්ටම අඩුවීම කෙරෙහි දැඩි බලපෑමක් ඇතිකර තිබේ.

ඉහත කරුණු සැලකිල්ලට ගෙන දේශිය නිෂ්පාදනය කළහැකි ආහාර වර්ග ගුණාත්මකව නිෂ්පාදනය කර ස්වයංපෝෂිත ඉලක්ක කරා ලඟාවීම හා එමගින් විශාල විදේශ විනිමයක් රටතුල ඉතිරි කර ගැනිම සඳහා අවශ්‍ය වන උපායමාර්ග හා ඊට අදාළ ක්‍රියාකාරකම් අන්තර්ගත වන පරිදි විෂයභාර අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතන ඒකාබද්ධ කරගනිමින් ''ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන'' 2016 - 2018 කාලය තුල ක්‍රියාත්මක කිරීමට සැලසුම් කිරිම අතිශය වැදගත් කටයුත්තක් සේ සලකමි.
මේ සඳහා දිරිදෙන සැමට තුති පුදමින් සත්කාර්ය අතිශයින් සාර්ථක වේවායි ලෙන්ගතුව ප්‍රාර්ථනා කරමි.

ෂාන් විජයලාල් ද සිල්වා,
ප්‍රධාන අමාත්‍ය - දකුණු පළාත.

# දකුණු පළාත් කෘෂිකර්ම අමාත්‍යතුමාගේ පණිවිඩය



ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ සංකල්පය අනුව ගරු කෘෂිකර්ම අමාත්‍ය දුමින්ද දිසානායක මැතිතුමාගේ මඟ පෙන්වීම යටතේ ක්‍රියාත්මක වන 2016/2018 ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන වෙනුවෙන් සුභ පැතුම් පණිවිඩයක් නිකුත් කිරීමට අවස්ථාව ලැබීම භාග්‍යයක් ලෙස සලකමි.

මෙම වැඩසටහන තුලින් අප දිවයින තුල නිෂ්පාදනය කළ හැකි දැනට විදේශයන්ගෙන් ආනයනය කරනු ලබන විවිධ ආහාර වර්ග අප රට තුල නිෂ්පාදනය කිරීම මෙන්ම මෙමඟින් විදේශයන් කරා ගෙන ගලායන අතිමහත් වූ මුදල ඉතිරි කර ගැනීමත් එම මුදල අත්‍යවශ්‍ය අනිකුත් සංවර්ධන කටයුතු සඳහා යෙදවීමට අපේක්ෂා කෙරේ. එසේම මෙම වැඩසටහන තුලින් දේශීය ගොවීන්ට වැඩි ආදායමක් ලබා ගැනීමට අවස්ථාව උදා කිරීම අපේක්ෂා කෙරෙන අතර පාරිභෝගිකයාට වඩාත් ගුණාත්මක ආහාර ද්‍රව්‍ය සැපයීමටද අපේක්ෂා කෙරේ.

අපගේ වත්මන් ආහාර පරිභෝජන රටාවන් රටේ සුලභව දක්නට ලැබෙන විවිධ රෝගීභාවයන්ට එක් බරපතල හේතුවක් ලෙස සැලකේ. මිනිස් ශරීරයට අහිතකර ආහාර වර්ග පරිභෝජනයෙන් ජනතාව මුදා ගැනීමටද අවකාශ සැලසෙනු ඇත. එසේම අපේක්ෂිත අකාරයටම මෙම වැඩසටහන ක්‍රියාත්මක කළහොත් පස නිසරු වීම ජල මූලාශ්‍රයට විෂ සහිත දෑ එක් වීම වලකා ලීම් මහෝපකාරී වනු ඇත.

සංක්ෂිප්තව සඳහන් කලහොත් මෙම ව්‍යාපෘතිය ආර්ථික වශයෙන් මෙන්ම සමාජීය වශයෙන්ද ඉතා විපුලදායි ව්‍යාපෘතියක් වේ.

මා මෙම වැඩසටහන සාර්ථකත්වය සඳහා මුළු හදවතින්ම සහ පතන අතරම දකුණු පළාත තුල මෙම වැඩසටහන සාර්ථක කරලීම සඳහා මාගේ අමාත්‍යාංශය සියලු නිලධාරිගේ ඉහළම දායකත්වය ලබා දීමට කැපවන බවද සඳහන් කරනු කැමැත්තෙමි.

දකුණු පළාත් කෘෂිකර්ම අමාත්‍යය
යූ.ජී.ඩී. ආරියතිලක

යම් ජන කෙනෙක් මල් ඵල උයන් වවන්නෝ වෙත් ද, පියවි වන වගා කොට දෙන්නෝ වෙත් ද, ඒදඬු පාලම් කරවන්නෝ වෙත් ද, යම් කෙනෙක් පැන් හලූත්, පැන් පොකුණුත්, ආවාසත් දේද ඔවුන්ට හැම කල්හී දහවලූත් රෑත් පිං පැමිණේ.

– බුදුන් වහන්සේ

# පටුන


01. හැඳින්වීම -------------------------------------------------------------------------------------- 1-2

02. පළාත් සිතියම ---------------------------------------------------------------------------------- 3

03. පළාත් ඉලක්ක සාරාංශය ---------------------------------------------------------------------- 4

04. ගාල්ල දිස්ත්‍රික්ක ඉලක්කය -------------------------------------------------------------------- 5-25

05. මාතර දිස්ත්‍රික්ක ඉලක්කය ---------------------------------------------------------------------- 26-53

06. හම්බන්තොට දිස්ත්‍රික්ක ඉලක්කය ------------------------------------------------------------- 54-76